# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2138/8 – 2019 අගෝස්තු 26 වැනි සඳුදා – 2019.08.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරළේ සුළු කොට්ඨාසයේ, බදුළුපිටිය, 78-J ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බදුල්ල නගරය (බදුළුපිටිය ගම, කොට්ඨාස අංක - 8) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක B/ACQ/BDL/2016/65 හා 2016.03.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ප්‍රමාණය: හෙක්. 0.0370**

උතුරට: ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, බදුල්ල ශාඛාව භුක්ති විඳින මුදුන්පිට මගුල්ලියද්ද සහ රඹුක්පොත රජමහා විහාරය හිමිකම් කියන මුදුන්පිට මගුල්ලියද්ද; නැගෙනහිරට: රඹුක්පොත රජමහා විහාරය හිමිකම් කියන මුදුන්පිට මගුල්ලියද්ද සහ සිමෙන්ති කාණුව; දකුණට: කැබලි අක්ෂර බී; බටහිරට: කැබලි අක්ෂර බී සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, බදුල්ල ශාඛාව භුක්ති විඳින මුදුන්පිට මගුල්ලියද්ද.

02. කැබලි අක්ෂර 'බී' – මුදුන්පිට මගුල්ලියද්ද – **ප්‍රමාණය:** හෙක්. 0.3164

උතුරට: ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, බදුල්ල ශාඛාව භුක්ති විඳින මුදුන්පිට මගුල්ලියද්ද සහ කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: කැබලි අක්ෂර ඒ, සිමෙන්ති කාණුව, බදුල්ල මහ නගර සභාව හිමිකම් කියන මල්වත්ත සහ මල්වත්ත පාර, බදුල්ල, මදුරසා මුස්ලිම් පල්ලිය හිමිකම් කියන සුසාන භූමිය; දකුණට: බදුල්ල මහ නගර සභාව හිමිකම් කියන මල්වත්ත, මල්වත්ත පාර, බදුල්ල, මදුරසා මුස්ලිම් පල්ලිය හිමිකම් කියන සුසාන භූමිය සහ බ/විහාරමහාදේවී බාලිකා මහා විද්‍යාලය භුක්ති විඳින මුදුන්පිට මගුල්ලියද්ද; බටහිරට: බ/විහාරමහාදේවී බාලිකා මහා විද්‍යාලය භුක්ති විඳින මුදුන්පිට මගුල්ලියද්ද සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, බදුල්ල ශාඛාව භුක්ති විඳින මුදුන්පිට මගුල්ලියද්ද.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2014/HA/80.
2019 මැයි මස 23 වැනි දින.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 – 314